# මහත්මා ගාන්ධිතුමාගේ සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරය පිළිබඳව කෙරෙන විමර්ශනයක්

*නන්ද, පූජ්‍ය ඉරුදෙණියායේ*[1]

ඉන්දියානුවන්ට නිදහස ලබා ගැනීම සඳහා මහත්මා ගාන්ධිතුමා ගෙන ගිය බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් ව්‍යාපාර ගණනාවකි. මේ අතරින් '**බ්‍රිතාන්‍යයන් විසින් පනවන ලද නීතිරීතිවලට ගරු නොකිරීම**' පදනම් කරගෙන සමස්ත ඉන්දීය ජාතික සංගම් කමිටුවේ පූර්ණ බලතල පැවරීම මත ගාන්ධිතුමන් විසින් ගෙන යන ලද '**බ්‍රිතාන්‍ය විරෝධී ව්‍යාපාරය**' නොහොත් '**සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරයට**' හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මේ සඳහා පාදක වූ ප්‍රධාන සිදුවීම් දෙකකි, එනම් 1991 අප්‍රේල් 19 සිදු වූ '**අම්රිත්සර් සංහාරය**' සහ '**බඩගෑමේ නීතිය**' පැනවීමයි. නිදහස පතා ආරම්භ කරන ලද මෙකී ව්‍යාපාරයේදී ගනු ලැබූ ක්‍රියාමාර්ග ගණනාවකි. එනම් අවිහිංසාවාදී ලෙස සත්‍යග්‍රහ පැවැත්වීම, රාජ්‍ය පාසල් සහ විශ්වවිද්‍යාල වර්ජනය, විදේශීය භාණ්ඩ වර්ජනය කිරීම, උද්ඝෝෂණ පැවැත්වීම, විදේශීය රෙදිපිළි පුළුස්සා දැමීම, ලුණු පිළිබඳ නීති කඩකිරීම, බදු නොගෙවීම ආදිය ඒ අතර කැපී පෙනේ. මෙම ව්‍යාපාරයට අනුප්‍රාණය ලබා දුන්නේ 1930 මාර්තු 12 ආරම්භ කරන ලද සුප්‍රසිද්ධ '**දණ්ඩි**' පා ගමනයි. ඉන්දියානුවන්ට වගකීම් සහිත පූර්ණ නිදහසක් ලබා ගැනීම ගාන්ධිතුමාගේ අපේක්ෂාව විය. දෙපාර්ශවය අතර වටමේස සාකච්ඡාවන් දෙකක් මේ සඳහා පැවැත්වුණු අතර, ඒ එකකුදු සාර්ථක නොවීය. සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරය බ්‍රිතාන්‍යයන්ගේ දැඩි මර්දනකාරී ප්‍රතිපත්තිය හමුවේ අසාර්ථක වුවද, ඉන්දියානුවන්ගේ අසීමිත දේශපාලන උද්යෝගය හා අවබෝධයක් ලබා දීමටත්, විප්ලවකාරී, ජාතිකානුරාගී හා දේශමාමක හැඟීම් වර්ධනය කරලීමටත් සමත් වූ '**සමාජ ව්‍යාපාරයක්**' ලෙස පෙන්වා දිය හැකිය. මෙහිදී '**ගාන්ධි**' (**ස්වයං ලිඛිත චරිතාපදානය**) කෘතිය මුල්තැන්හි තබා ගනිමින් සෙසු ද්විතීයික මූලාශ්‍රයද භාවිත කෙරිණි.

ප්‍රමුඛ පදඃ නිදහස, මහත්මා ගාන්ධි, සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරය, බ්‍රිතාන්‍ය විරෝධී ව්‍යාපාරය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ඉතිහාස අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*nanda91619@gmail.com*